අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය
நீதிச்சேவை ஆணைக்குழுச் செயலகம்
Judicial Service Commission Secretariat

JUDICIAL SERVICE COMMISSION SECRETARIAT | JUDICIAL SERVICE COMMISSION SECRETARIAT | JUDICIAL SERVICE COMMISSION SECRETARIAT | JUDICIAL SERVICE COMMISSION SECRETARIAT | JUDICIAL SERVICE COMMISSION SECRETARIAT | JUDICIAL SERVICE COMMISSION SECRETARIAT | JUDICIAL SERVICE COMMISSION SECRETARIAT

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My No. | Jsc/Court/Pro.Assi./2022 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No. | MOJ/E07/DO/නව පත්වීම් | දිනය<br>திகதி<br>Date | 2022.02.10 |

ලේකම්,
අධිකරණ අමාත්‍යාංශය,
කොළඹ 12.

**<u>අධිකරණවල සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන්ගේ අනුයුක්ත කිරීම් හා ස්ථාන මාරු කිරීම් සම්බන්ධව කටයුතු කිරීම</u>**

ශීර්ෂගත කරුණ සම්බන්ධයෙන් වූ ඔබේ සමාංක හා 2022.02.03 දිනැති ලිපිය හා බැඳේ.

02. එහි සඳහන් කරුණු අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර අධිකරණ සේවා කොමිෂන් සභා තීරණය පිළිබඳව ඔබට දැනුම් දෙන තුරු අධිකරණවල සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන්ගේ අනුයුක්ත කිරීම් හා ස්ථාන මාරු කිරීම් සම්බන්ධව මෙතෙක් කටයුතු කරන ලද ආකාරයටම ඉදිරියටත් කටයුතු කරන බව කාරුණිකව දන්වමි.

එච්.එස්. සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

පිටපත් :

සියලුම
මහාධිකරණ විනිසුරුවරුන්,
සිවිල් අභියාචනා මහාධිකරණ විනිසුරුවරුන්,
දිසා විනිසුරුවරුන්,
මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්,
අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්

} 2022.02.03 දිනැති ලිපියේ පිටපතක් අමුණා ඇත.



තැ.පෙ. 573, අළුත් කඩේ, කොළඹ 12. த.பெ.இல. 573, புதுக்கடை, கொழும்பு 12. P.O. Box 573, Hulftsdorp, Colombo 12.
ලේකම් / செயலாளர் / Secretary (+94) 11 2321104
කාර්යාලය / அலுவலகம் / Office (+94) 11 2433119 / 2451159
(+94) 11 2446111
jscinformaion@jsc.gov.lk
www.jsc.gov.lk

දුරකථනය / தொலைபேசி / Telephone 2449959
ලේකම් / செயலாளர் / Secretary
ෆැක්ස් අංකය / பெக்ஸ் இல. / Fax No. 2445447
E-Mail: secretary@moj.gov.lk
ප්‍රධාන කාර්යාලය / பொது அலுவலகம் / General Office
දුරකථනය / தொலைபேசி / Telephone 2323022
ෆැක්ස් අංකය / பெக்ஸ் இல. / Fax No. 2320785
Web Site: www.moj.gov.lk

**අධිකරණ අමාත්‍යාංශය**
**நீதி அமைச்சு**
**MINISTRY OF JUSTICE**

ටෙලිමේල් / Tele / ரெலிமெயில் — අධිකරණ ලේකම් / நீதிச்செயலாளர் / Secminjust
තැ.පෙ. / தபால்பெட்டி / P.O. Box. 555
ඉලෙක්ට්‍රෝනික තැපැල / மின்அஞ்சல் / E-mail info@moj.gov.lk
උපරිමාධිකරණ සංකීර්ණය
කොළඹ 12
மீயுயர் நீதிமன்ற கட்டிடத்தொகுதி
கொழும்பு 12
Superior Courts Complex,
Colombo 12.

JUDICIAL SERVICE COMMISSION SECRETARIAT — 07 FEB 2022 — COLOMBO 12

මගේ අංකය / எனது இல / My No. MOJ/E07/DO/නව පත්වීම්
ඔබේ අංකය / உமது. இல. / Your No.
දිනය / திகதி / Date 2022.02.03

ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

**<u>අධිකරණ වල සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන්ගේ අනුයුක්ත කිරීම් හා ස්ථානමාරු කිරීම් සම්බන්ධව කටයුතු කිරීම</u>**

අධිකරණවල ගිණුම් සහකාර සහ වැඩසටහන් සහකාර තනතුරු සඳහා 2005/2006 වර්ෂවලදී බඳවාගත් උපාධිධාරීන්ගේ පත්වීම් බලධාරියා අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා වන අතර, ඔවුන්ගේ පත්වීම් ලිපි අනුව එම නිලධාරීන් අධිකරණ අමාත්‍යාංශය මඟින් බඳවාගෙන අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත අනුයුක්ත කර ඇත. එම නිලධාරීන් අධිකරණ සේවා කොමිෂන් සභාවට පත්වීම් බලධාරියා වන අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සෘජුවම අනුයුක්ත කර ඇති බැවින්, ඔවුන් අධිකරණ වෙත අනුයුක්ත කිරීම අධිකරණ සේවා කොමිෂන් සභාව මඟින් සිදු කර ඇත.

02. 2012 වර්ෂයෙන් පසුව ඉහත නිලධාරීන්ට ඒකාබද්ධ සේවයට අයත් සංවර්ධන නිලධාරි සේවයට අන්තර්ග්‍රහනයට අවස්ථාව ලැබුණු අතර එම අන්තර්ග්‍රහනය වූ සියලු නිලධාරීන්ගේ පත්වීම් බලධාරියා වන්නේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වේ. ඒ අනුව අධිකරණවල සේවයේ නියුතු සියළු සංවර්ධන නිලධාරීන් ද ඒකාබද්ධ සේවයේ නිලධාරීන් සඳහා යොදාගන්නා ස්ථානමාරුවීම් ක්‍රමවේදයන්ට හා වාර්ෂික ස්ථානමාරුවීම් වලට යටත් වේ. එසේම රැකියා විරහිත උපාධිධාරීන් සංවර්ධන නිලධාරී සේවයට බඳවා ගැනීමට රජයේ ප්‍රතිපත්තියක් ක්‍රියාවට නැංවීමක් ලෙසට සිදු වූ බැවින් ඔවුන් සේවා ස්ථාන වෙත අනුයුක්ත කිරීම සහ ස්ථානමාරු ලබා දීම ද රජයේ ප්‍රතිපත්තිවලට උපරිම වශයෙන් අනුගත වෙමින්, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය සමඟ සමීප සම්බන්ධීකරණයක් සිදු කළ යුතු වේ.

03. 2016 වර්ෂයේ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ඉහත නිලධාරීන්ගේ අනුයුක්ත කිරීම් හා වාර්ෂික ස්ථාන මාරු අධිකරණ සේවා කොමිෂන් සභාව මඟින් සිදු කිරීමට දන්වා ඇති අතර, ඒ අනුව එසේ සිදු කිරීමට එවකට සිටි අතිරේක ලේකම්(පාලන) ගේ අංක ඊජ්/01/විවිධ හා 2016.06.24 දිනැති ලිපිය මඟින් අනුමැතිය ලබා දී ඇතත්, එය අමාත්‍යාංශ ලේකම්වරයාගේ හෝ සංවර්ධන නිලධාරීන්ගේ පත්වීම් බලධාරියා වන ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ විධිමත් අනුමැතියක් රහිතව ලබා දුන් අනුමැතියක් බව කාරුණිකව දන්වමි.

SAS (Bandara)
F. N. A. Please
Secretary
J. S. C.
07/02/2022

HDM
08/02/2022

04. තවද 2021.08.06 දිනැති අංක 01/2021 දරණ ඒකාබද්ධ සේවා චක්‍රලේඛයට අනුව සංවර්ධන නිලධාරීන්ගේ අභ්‍යන්තර ස්ථානමාරු සිදු කරන්නේ නම් අදාළ අභ්‍යන්තර ස්ථාන මාරු පටිපාටිය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගත යුතු වේ. එබැවින් උක්ත කරුණ කෙරේ ඔබගේ අවධානය යොමු කරමින් අධිකරණවල සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන්ගේ ස්ථානමාරු හා ආයතනික කටයුතු සම්බන්ධයෙන් පැන නගින ප්‍රායෝගික ගැටළු අවම කර ගැනීම සඳහා ද, එම නිලධාරීන් අධිකරණ වෙත අනුයුක්ත කිරීම් හා අභ්‍යන්තර ස්ථාන මාරු අධිකරණ අමාත්‍යාංශය මඟින් සිදු කරන බව ද ,එම නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු සිදු කළ හැක්කේ පත්වීම් බලධාරියා වන ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බව ද, කාරුණිකව දන්වා සිටිමි.

05. ඒ අනුව ඒකාබද්ධ සේවයට අන්තර්ග්‍රහණය නොවූ සංවර්ධන සහකාර නිලධාරීන්ගේ අනුයුක්ත කිරීම් හා වාර්ෂික ස්ථාන මාරු පෙර ආකාරයටම අධිකරණ සේවා කොමිෂන් සභාව විසින්ම සිදු කරන ලෙසටද , වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

**එම්.එම්.පී.කේ.මායාදුන්නෙ**
ලේකම්
අධිකරණ අමාත්‍යාංශය